මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
| දිනය | **2021.04.23** |

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද සංශෝධිත නියෝග

දේශසීමා අතර විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීමේ දී වැඩි කාර්යක්ෂමතාවයක් ළඟා කර ගැනීමත් සමග පාර්ශව කරුවන්ගේ ව්‍යාපාර කිරීමේ පහසුව තුළින් ආර්ථික කටයුතු සඳහා තවදුරටත් පහසුකම් සැපයීමේ අරමුණින් යුතුව 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි තවදුරටත් සරල කිරීම සහ පැහැදිලිතාව වැඩිදියුණු කිරීම සඳහා සංශෝධනය කරන ලදී.

ඉහත ඉස්මතු කර ඇති පරිදි මෙම සංශෝධිත විදේශ විනිමය ප්‍රතිපත්ති රාමුව 2021 මාර්තු 22 දින සිට වලංගු වනු ඇත. එසේ හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අතරින් ප්‍රධාන කරුණු පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා රජය සහ රජය සතු ව්‍යවසායයන් ඇතුළුව ශ්‍රී ලංකාවේ නේවාසිකයන්ට ණය ලබා දීමේදී විදේශීය ආයෝජකයන්/ණය දෙන්නන් විසින් ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) විවෘත කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය ඉවත් කිරීම.

ආ. ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් විදේශයන්ගෙන් විදේශ විනිමය ණය ගැනීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් "විදේශ වාණිජ ණය ගැනීමේ ගිණුම (ECBA)" නමින් නව ගිණුමක් හඳුන්වා දීම.

ඇ. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම්වලට (ශාඛා කාර්යාල, සම්බන්ධතා කාර්යාල, ව්‍යාපෘති කාර්යාල ආදිය) ශ්‍රී ලංකාවෙන් පිටත තම මව් සමාගම්වලින් ණය ලබා ගැනීම සඳහා පොදු අවසරයක් ලබාදීම.

ඈ. නේවාසික නොවන ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවේ සංස්ථාගත නොවූ සහ කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති සමාගම්වල කොටස් හෝ ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා අරමුදල් බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යන ආමුඛ ආයෝජන ගිණුම හරහා යොමු කිරීම වෙනුවට අක්වෙරළ බැංකු ඒකකවල පවත්වාගෙන යන ගිණුම් හරහා යොමු කිරීම සඳහා පොදු අවසරයක් ප්‍රදානය කිරීම.

ඉ. විගාමිකයාගේ වර්තමාන ආදායම ප්‍රේෂණය කිරීම සඳහා 'විගාමිකයාගේ ප්‍රේෂණය කළහැකි ආදායම් ගිණුම (ERIA)' නමින් අතිරේක ගිණුමක් හඳුන්වා දීම.

ඊ.	අනේවාසික රුපියල් ගිණුම් (NRRAs) සහ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRAs)වල ඇති අරමුදල්වලින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා විගාමිකයන්ට අවස්ථාව ලබා දීම.

ඔ.	ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු ලෙස විදේශ විනිමය උපයාගත්/ලබාගත් දැනට ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් සහ විදේශයන්ගෙන් ණය ලබා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය වන මූල්‍ය ආයතනයක් සමග ගිණුමක් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙමින් පොදු අවසරයක් ලබා දීම.

ඕ.	ශ්‍රී ලංකාවෙන් පිටත සේවය කරන ශ්‍රී ලාංකිකයන්ට (විගාමිකයන් හැර) ශ්‍රී ලංකාවේ රුපියල් වලින් උපයන ලද අරමුදල් බැර කිරීම සඳහා සහ දේශීය ගෙවීම් සිදු කිරීම සඳහා  ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට පොදු අවසරයක් ලබාදීම.

ඌ.	ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ ස්ථාපනය කරන ලද ලැයිස්තු ගත හෝ ලැයිස්තු ගත නොවන ආයතන සහ තනි පුද්ගල ව්‍යාපාර යනුවෙන් නව සුදුසුකම් ලත් නේවාසික ආයෝජක කාණ්ඩ තුනක් හඳුන්වා දීම.

ඍ.	සංචාරක දීමනාව ලෙස ලබාගත් භාවිතයට නොගෙන ඉතිරි වූ විදේශ ව්‍යවහාර මුදල් අලුතින් විවෘත කරනු ලබන හෝ දැනටමත් පවත්වාගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල තැන්පත් කිරීමට අවසර දීම.

වැඩි විස්තර සඳහා කරුණාකර 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හෝ www.dfe.lk වෙබ් අඩවියට පිවිසෙන්න. නැතහොත් 011 2477255/433/207/375 යන දුරකථන අංකවලට විදේශ විනිමය දෙපාර්තමේන්තුව අමතන්න.